# තහංචි මැද්දෙන්

## පුරවැසි - මාධ්‍යකරුවකුගේ සටහන්

2007..01.07

## මන්නාරමේ දරුවෝ

එල්ටීටීඊ මුහුදු කොටි කඳවුරකට යැයි ජනවාරි 02දා උදෑසන එල්ල කළ ගුවන් හමුදා කෆීර් ප්‍රහාරයක් නිසා මන්නාරමේ පදුතුරෙයි ගම්මානයේ සිවිල් වැසියන් ගණනාවක් මිය යාම දැන් ප්‍රසිද්ධ කරුණකි. එම ප්‍රහාරයෙන් ළබාල දරුවන් මිය ගිය බව ද ඡායාරූපමය සාක්ෂි මගින් තහවුරු වූ ඇත්ත කරුණකි.

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මානුෂීය කටයුතු පිළිබඳ කාර්යාලය ද මෙම ප්‍රහාරය නිසා සිවිල් වැසියන් මිය යාම පිළිබඳ සිය කනස්සල්ළ පල කරමින් ජනවාරි 03 දා නිවේදනයක් නිකුත් කළේ ය.

මන්නාරමේ අදරදගුරු රාසප්පු ජෝෂප් හිම්පානන් නිවේදනයක් නිකුත් කරමින් කියා සිටයේ මෙම ගුවන් ප්‍රහාරය නිසා 1995 සිටම යාපනයෙන් අවතැන්ව ඉතා දුකසේ ජීවත් වූ ගම්මානයක් ම විනාශ වී ගිය බව යි.

මෙම ප්‍රහාරයෙන් සිදුවූ විපත පිලිබඳව 02දා සවස් වන විට කොළඹට තොරතුරු ලැබී තිබුනි. රොයිටර් පුවත් සේවය විපතට පත් සිවිල් වැසියන්ගේ විශේෂයෙන්ම දරුවන්ගේ ඡායාරූප පවා ලොව පුරා බෙදා හැර තිබුණි. මෙරට ප්‍රධාන පෙලේ පුවත් පත් ආයතන සියල්ල වෙත රොයිටර් පුවත් සේවයේ ඡායාරූප එවලේම ලැබේ. බීබීසී සහ ඒ.එප්.පී, වැනි අන්තර් ජාතික පුවත් සේවාවන්ද සිවිල් වැසියන් මියයාම පිලිබඳව පැහැදිලි වාර්තා ලොව පුරා බෙදා හැරියේය.

පුවත්පත් හැර කොළඹ පල වන ප්‍රධාන පෙලේ දෙමළ පුවත්පත් තුනම සිය මුල්පිට විශේෂ ශීර්ෂපාඨ පුවතක් ලෙස මිය ගිය සහ තුවාල ලද දරුවන්ගේ වර්ණ පින්තූර ඇතිව මෙම පුවත පළ කළේ ය.

කොළඹ ඉංග්‍රිසි පුවත්පත් මෙම පුවත විවිධ අන්දමින් වාර්තා කලේ ය. නමුත් ඒ සෑම පුවත්පතක්ම කවර අයුරකින් හෝ සිවිල් වැසියන් මිය ගිය බවට වූ වාර්තා සඳහන් කිරීමට වග බලා ගත්තේ ය. ඩේලි මිරර් සහ මොනිං ලීඩර් පුවත් පත් සෑම පාර්ශවයක්ම ආවරණය වන පරිදි ප්‍රමුඛත්වයක් ඇතිව වාර්තා කලේ ය. නමුත් තුවාල ලද දරුවකුගේ ඡායාරූපයක් මුල් පිට පල කිරීමට ධෛර්‍ය තිබුනේ මොනිං ලීඩර් පුවත්පතට පමණි.

කණගාටුදායකම වාර්තාකරණය තිබුනේ සිංහල පුවත්පත්හි ය. ඒ අතරින් ලක්බිම පුවත්පතෙහි ය. එහි ශීර්ෂ පාඨය වුයේ ***මුහුදු කොටි 300ක් රුස්ව සිටි මන්නාරම් කඳවුරට ගුවන් ප්‍රහාරයක්*** යනුවෙනි. එවැනි පුවතක් අඩුම වශයෙන් ආණ්ඩුව පවා ගොතා බෙදා හැරියේ නැත. සිවිල් වැසියන් ඝාතනය වීම පිලිබඳව එහි වචනයක්වත් නොතිබුණි.

සාමාන්‍යයෙන් මෙවැනි ප්‍රහාරයක් උලුප්පා දක්වන දිවයින පුවත්පත මෙම අවස්ථාවේ මෙම පුවත එතරම් කැපී පෙනෙන ලෙස පළ කලේ නැත.  සුපුරුදු පරිදි එය කියා සිටියේ ***ගුවන් ප්‍රහාරයෙන් මුහුදු කොටි කඳවුරක් සම්පූර්ණයෙන් ම වැනසේ*** කියා ය. ලංකාදීපය ද සාමාන්‍ය පුවතක් ලෙස මෙසේ වාර්තා කලේ ය: ***ගුවන් ප්‍රහාරයෙන් මුහුදු කොටි කඳවුරක් වැනසෙයි. වැසියන් 17ක් මිය ගියැයි කොටි චෝදනා කරති*** කියා ය. සිවිල් වැසියන් මිය යාම පුවතෙහි ශීර්ෂ පාඨයට ගත් එකම සිංහල පුවත්පත් ලංකාදීප යයි. කිසිදු සිංහල පුවත්පතක් තුවාල ලද හෝ මිය ගිය දෙමළ දරුවකුගේ ඡායාරූපයක් පළ කළේ නැත.

සිංහල පෙදෙස්හි දරුවන් එල්ටීටීඊ ප්‍රහාරයන්ට ලක්ව මිය ගිය විට කරන වාර්තාකරණය සහ ආණ්ඩුවේ හමුදා ප්‍රහාර මගින් දරුවන් මිය ගියවිට කැරෙන වාර්තාකරණය අතර ඇති මෙම වෙනස පැහැදිලි කළ හැකි ජනමාධ්‍ය ආචාර ධර්මය කුමක්ද?

එම ප්‍රශ්නයම දෙමළ ජනමාධ්‍ය කෙරෙන් ද ඇසිය යුතු ය: මෙම අවස්තාවේදී දෙමළ දරුවන්ගේ විපත වාර්තා කල ආකාරයෙන් ම එල්ටීටීඊ ප්‍රහාරයන්ගෙන් මිය යන සිංහල සහ මුස්ලිම් දරුවන්ගේ විපත් වාර්තා නොකිරීම සාධාරණ කරන ජනමාධ්‍ය ආචාර ධර්මය කුමක්ද?

මෙම පුවත්පත් කණ්ඩායම් දෙකෙහිම හිමිකරුවන් ද කතුවරුන් ද එක්ව යහපත් ජනමාධ්‍ය ඉගැන්වීම පිනිස ජනමාධ්‍ය පාසැලක් පවත්වා ගෙන යන බව ද ආචාර ධර්මමාලාවක් මත පුවත්පත් පැමිණිලි කොමිසමක් පවත්වා ගෙන යන බව ද නොකීවොත් මෙම සටහන අසම්පූර්න ය.

## 2006 - අපට ගෙවුනු හැටි

අවිරුද්දක් අවසානයේ ආපසු හැරී බැලීම සිරිතක්. පසුගිය වසරේ ඝාතනය වූ මාධ්‍යවේදීන් සහ මාධ්‍ය සේවකයින් ගේ ලැයිස්තුව පෙන්වන්නේ 2006 දී 1989-90 වසරට පසු එලඹුණු බිහිසුනුම වසරකට මෙරට ජනමාධ්‍යවේදීන් මුහුණ දුන් බව යි.

අවිරුද්ද ආරම්භ වුනේ ම ඝාතනයකින්. ජනවාරි 24 දා ත්‍රිමලයේ ජනමාධ්‍යවේදී රාජන්, (සුබ්‍රමනියම් සුගීර්ධරාජන්) වෙඩි තබා මරා දැමුණා. ඔහු මරා දැමීමට හේතු වූ බව පේන්න තිබුනේ වෙඩි තබා මරා දමන ලද දෙමළ ශිෂ්‍යයින් පස් දෙනාගේ වෙඩි වැදුණු ජායාරූප තිනක්කුරල් පුවත්පතට ලබා දීම යි.

අවුරුද්ද අවසාන වුයේ හදිසි අනතුරකට ලක් වු වී රේඩියෝවේ රුක්ෂිකා ප්‍රියදර්ශිනීගේ මරණයෙන්. ඒ දෙසැම්බර් 19දා. ඇය සිය මාධ්‍ය ආයතනය වෙත් යමින් සිටිය දී අතිවූ මෙම අනතුර මහත් ආන්දෝලනයකට තුඩු දුන්නා.

වසර මැද මැයි 02දා යාපනයේ උදයන් පුවත්පතේ සුරේෂ් කුමාර් සහ රංජිත් කුමාර් යන සේවකයින් දෙදනාට කාර්‍යාලය ඇතුලේ ම වෙඩි තබා මරා දැමුණා. ඒ කොළඹ දි ජාත්‍යන්තර ජනමාධ්‍ය දිනය සමරා අන්තර් ජාතික උත්සවයක් පැවැත්වෙත්දී.

ජූලි දෙවැනිදා සත්දින මාධ්‍යවේදී සම්පත් ලක්මාල් වෙඩි තබා මරා දැමුනේ දෙහිවල දී. අතුරුදහන් වු පතාල කල්ලියක් වෙඩිතබා මරා පුල්ස්සා ඇතැයි පළ වූ වාර්තාවක් ඔහු හදිසියේ මරා දැමීමට හේතු වු බවට කතා පැතිරුණා.

වසර මැද දි කොළඹ සුදරෝලි පුවත්පත් මුද්‍රණාලයට එල්ල වූ ප්‍රහාරයකින් එහි සේවය කළ ආරක්ෂක නියාමකයකු මිය ගියා.

ජූලි 27වනදා ක්ලේ මෝ බොම්බයකට හසුව යාපනයේ පුවත්පත් බෙදා හරින්නකු වූ මරියදාස් මනෝජනරාජ් මිය ගියා. ඔහුගේ මරණය සැළසුමක් ද අහම්බයක් ද යන්න ගැන ගැටලුක් ඉතිරි වුණා.

අගොස්තු 16වනදා උදයන් පුවත්පතෙහි රියැදුරු සතාසිවම් බාස්කරන් පුවත්පත් බෙදා ආපසු එන අවිස්ථාවේ දී ඔහුට වෙඩි තබා මරා දැමුණා. එම වාහනයේ උදයන් පුවත්පතෙහි නම පැහැදිලිව සදහන් වී තිබුණා.

අගෝස්තු 11දා යාපනයේ නවදු ඊළනාදු පුවත්පතෙහි කළමනාකාර කර්තෘ සින්නතම්බි සිවමහාරාජාට වෙඩි තබා මරා දැමුණා. ඉන් පසු එම පුවත්පත වසා දැමුණා.

සුනන්ද දේශප්‍රිය